**ශීර්ෂය 186 - තාක්ෂණ අමාත්‍යාංශය**
**-------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**---------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

තාක්ෂණ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තාක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**-------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**-----------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

තාක්ෂණ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 මූල්‍ය නොවන වත්කම්**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ අමාත්‍යාංශ පොත් අනුව රු.150,000,000 ක් ලෙස දක්වා තිබූ නමුත් භාණ්ඩාගාරයේ පොත් අනුව (ගිණුම් ප්‍රකාශ අංක 10 ) එහි අගය රු.40,000,000 ක් විය. එනම් රු.110,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති විෂමතාවයන් නිවැරදි බව පිළිගනිමි. එම විෂමතාවය සිදුවී ඇත්තේ පළමුවෙනි භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය 2022.01.31 දින ලැබීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර දෙවන භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය පරීක්ෂා කිරීම් අත පසුවී ඇති බැවිනි.<br>නැවත එවැනි අතපසුවීම් සිදු නොවන අකාරයට අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගන්නා ලෙස අදාල අංශ ප්‍රධානිට උපදෙස් ලබා දුනිමි. | අමාත්‍යාංශයේ පොත්වල හා භාණ්ඩාගාරයේ පොත්වල ශේෂයන් එකිනෙක සැසඳෙන පරිදි එම ලේඛන පවත්වාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන්ට අදාළ මු.රෙ. මාරුකිරීම් අමාත්‍යාංශ පොත් අනුව රු.510,000,000 ක් ලෙස දක්වා තිබූ නමුත් භාණ්ඩාගාරයේ පොත් අනුව (ගිණුම් ප්‍රකාශ අංක 12 ) අගය රු.400,000,000 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන් අමාත්‍යාංශ පොත් අනුව රු.4,370,480,000 ක් වූ අතර භාණ්ඩාගාරයේ පොත් අනුව (ගිණුම් ප්‍රකාශ අංක 10 ) එහි අගය රු.4,480,480,000 ක් විය. | - එම - | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ 85 පරිදි මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු සකස්කර නොතිබුණි. | තාක්ෂණ අමාත්‍යාංශය 2020.11.20 දිනැති අංක 2202/25 දරණ අතිරේක ගැසට් පත්‍රය අනුව 2020.11.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි තාක්ෂණ අමාත්‍යාංශය නමින් නව අමාත්‍යාංශයක් පිහිටුවන ලදී. මේ සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම අමාත්‍යාංශය මඟින් සිදු නොකරන ලද අතර භාණ්ඩාගාරය විසින් ලබාදුන් ඇස්තමේන්තු ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශය භාවිතයට ගෙන තිබුණි. | නිසි පරිදි මූලික ඇස්තමේන්තු සංශෝධිත ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත් ඒඅනුව කටයුතු නොකිරීම නිසා වැය විස්තරයන් 10 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.මි 60 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | කාර්යය මණ්ඩල ලබා ගැනීම අමාත්‍යය කාර්යාලයට හා අමාත්‍යාංශයට මාස කීපයක් යන තෙක් සිදු නොවූ බැවින් හා අදාළ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම වර්ෂයේ මැද භාගයක් වන තෙක් සිදු නොවූ බැවින් ඔබ විසින් සඳහන් කර ඇති ආකාරයට ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවී තිබේ. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කොට අවශ්‍ය ප්‍රමාණයට පමණක් ප්‍රතිපාදන වෙන්කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) වැයවිෂයන් 09 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රු. 195,915,000 ක් වූ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 99 දක්වා පරාසය තුළ එකතුව රු.180,209,037 ඉතිරිවීම් තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | - එම - | - එම - |

## 2.2 අත්තිකාරම් ගිණුම් සීමා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ 506 (ඩී) ප්‍රකාර රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම අමාත්‍යාංශ පොත් වලට අනුව වියදම් උපරිම සීමාව, අවම ලැබීම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව පිළිවෙලින් රු.60,000,000, රු. 140,000 ක් හා රු.2,500,000 ක් ලෙස සංශෝධනය වී තිබුණද භාණ්ඩාගාර පොත් අනුව එහි අගය පිළිවෙළින් රු.60,000,000, රු.25,000,000 ක් හා රු.100,000,000 ක් ලෙසට දක්වා තිබුණි. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ සීමා සංශෝධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් **MOT/FIN/Pub.Adv** හා 2021.12.30 දිනැති ලිපිය මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කරන ලදී. එම ඉල්ලීමට අනුව සීමා සංශෝධනය කර තිබුණද එය **CIGAS** වැඩසටහනට ඇතුලත් විමට හැකිවන පරිදි කටයුතු කිරීම ලේඛන අස්ථානගත වීම නිසා අවශ්‍ය වේලාවේදී සිදුකිරීම අතපසුවී තිබේ. එහෙත් අවසාන ගිණුම් සකස් කිරීමේදී අවශ්‍ය සංශෝධිත සීමාවන් වල ලිඛිත දැනුම්දීම ලබාගත හැකිවීම නිසා එම අවස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කරන ලදී. ඉදිරියේදි මෙවැනි අඩුපාඩු සිදු නොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. | අමාත්‍යාංශ පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් බී ගිණුම් සීමාවන් එකිනෙක සැසඳෙන පරිදි ලේඛන නිවැරදිව පවත්වාගත යුතුය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය පවත්වාගෙනයාම සඳහා වෙන්කරගෙන තිබූ වර්ග අඩි 7512 ක ප්‍රමාණයෙන් වර්ග අඩි 2300 ක් (කාමර අංක 1105 ට අයත් ) විගණිත දිනය වූ | අමාත්‍යාංශය ඉඩ පහසුකම්වලින් තොරව ICTA ආයතනයේ එක් කාමරයක් තුල නිසි පහසුමක් නොමැතිව රාජකාරි කටයුතු කරගෙන යන ලදී .2021.06.30 දින වන විට | රටේ ආර්ථිකයට ගැලපෙන ලෙස අවම පිරිවැයක් වැයවන පරිදි |

| | | |
|---|---|---|
| 2022 මාර්තු 11 වන විටත් කාර්යාලීය කටයුතු සිදු කිරීමට හැකිවන ආකාරයට වැඩිදියුණු කිරීමක් (Partition) සිදු නොකර කුලියට ගෙන මාස 06 කට ආසන්න කාලයක් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය. | ICTA ආයතනය වෙනත් ගොඩනැගිල්ලකට රැගෙන යායුතු බැවින් එදිනට ප්‍රථම අමාත්‍යාංශය වන් ගෝල් ෆේස් වෙත රැගෙන යාමට සිදු විය. මේ හේතුවෙන් කාර්යාල පරිශ්‍රය බෙදා වෙන් කර වැඩි දියුණු කිරීමක් සිදු කිරීම සඳහා කාලයක් නොතිබුණි. සීඝ්‍ර මිළ වැඩි වීම් හේතුවෙන් සැපයුම්කරුවන් විසින් මිළ ගණන් ඉහළ දැමීමට කටයුතු කරන ලදී .මේ හේතුවෙන් බෙදා වෙන් කිරීම් නිසි පරිදි සිදු කර ගැනීමට හැකියාවක් නොමැති විය. | අමාත්‍යාංශ සඳහා ගොඩනැගිලි තෝරාගත යුතු අතර උපරිම කාර්යක්ෂම තාවයෙන් අදාල සම්පත් භාවිතා කිරීමට පියවර ගතයුතුය. |

## 3.2 කළමනාකරණ දූර්වලතා

---------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------------ | --------------- |
| (අ) අමාත්‍යාංශය පවත්වාගෙනයාම සඳහා කාර්යාල පරිශ්‍රයක් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව අමාත්‍යාංශය විසින් රු.1,878,000 ක මාසික බිම්කුලිය වශයෙන් ෂැංගිරිලා හොටෙල්ස් ලංකා පෞද්ගලික සමාගම වෙත ගෙවමින් වන් ගෝල්ෆේස් කුළුණෙහි කාර්යාලය පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. | තාක්ෂණ අමාත්‍යාංශය වන් ගෝල්ෆේස් ආයතනය සමඟ 2021 සැප්තැම්බර් මස 22 දින ඇති කරගත් බදු ගිවිසුම අනුව එහි 11 වන මහලේ වර්ග අඩි 7512 ක ප්‍රමාණයක් සඳහා රු.1,878,000 ක් බිම්කුළිය ලෙස Shangri-La Hotels Lanka (Private) Limited වෙත ගෙවනු ලැබේ.<br>ගරු ජනාධිපතිතුමා යටතේ ඇති අමාත්‍යාංශයක් වශයෙන් 2020.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් 2020.11.18 සිට ක්‍රියාත්මක වන පරිදි තාක්ෂණ අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද අතර ජනාධිපතිතුමාගේ වාචික උපදෙස් මත ජනාධිපති කාර්යාලයේ සිට විනාඩි කිහිපයකින් ළගා විය හැකි එයට ඉතා සමීප මෙන්ම ගරු ජනාධිපතිතුමා නිරන්තරයෙන් අමාත්‍යාංශයට පැමිණෙන බැවින් ආරක්ෂාව පිළිබඳ විශේෂ අවධානයක්ද යොමුකර අමාත්‍යාංශය සඳහා ස්ථානයක් තෝරා ගැනීමට අවධානය යොමු කරන ලදී . | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය, ශ්‍රී ලංකා ජීව තාක්ෂණික ආයතනය, කාර්මික තාක්ෂණික ආයතනය හා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව යන ආයතන වෙනුවෙන් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් ලෙස පිළිවෙලින් රු.875,354,212 ක් හා රු.986,617,824 බැගින් වැයකර තිබුණි. එහෙත් එකී ආයතන වලින් ඉටුකරනු ලබන කාර්යභාරය හා කාර්යසාධනය ඇගයීමකට ලක්කිරීම පිණිස ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමේ කාර්යභාරය 2021 වර්ෂයේ සිට විගණිත දින වූ 2022 මාර්තු 29 දක්වාම ඉටුවී නොතිබුණි. | අමාත්‍යාංශය සඳහා අවශ්‍ය සේවකයින් අනුයුක්ත නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශයේ කටයුතු මනා ලෙස සංවිධානය කර ගැනිමට නොහැකි විය. එහෙත් ලබා දුන් නිලධාරීන් යොදාගෙන එම ආයතනවල ප්‍රධානීන්ගේ සහයෝගයෙන් අවශ්‍ය සියළු කාර්යයන් සිදු කරමින් මනා ලෙස කළමනාකරණය කිරීම සිදුකරන ලදී. ප්‍රගති සමාලෝචන රැස්වීම් අවශ්‍ය අවස්ථා සිදු කිරීම සිදුකරන ලද අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් හා සම්පත් නොමැතිවීම තුළ අඩුපාඩු සිදුවී තිබුණි. එහෙත් මේ වන විට ප්‍රධාන අභ්‍යන්තර විගණකද මෙ සඳහා සම්බන්ධ කර ගනිමින් අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන අතර ඉදිරියේදී නියමිත පරිදි ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය පියවර ගනිමි. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කාර්යසාධනය ඇගයීමට ලක්කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් නිසිපරිදි පැවැත්විය යුතුය. |
| (ඇ) | නැනෝ තාක්ෂණ (පුද්ගලික) සමාගම පර්යේෂණ ව්‍යාපෘති මඟින් සොයාගත් නව තාක්ෂණයන් ජාතික අවශ්‍යතාවයන් සඳහා සුදුසු පරිදි උපයෝගී කරලීම සඳහාත්, නව සොයා ගැනීම් සඳහා පුළුල් වෙළඳපොලක් ලබාදීම සඳහාත් රාජ්‍ය මැදිහත්වීම අමාත්‍යාංශ මට්ටමින් අවශ්‍ය පරිදි සිදුවී නොතිබුණි. | තාක්ෂණ අමාත්‍යාංශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020 නොවැම්බර් මස 20 දිනැති අංක 2202/25 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව 2020 නොවැම්බර් මස 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවන ලදී.. නිලධාරීන්ගේ හිඟය කොරෝනා වසංගතය වසර දෙකක් තුළ පැවතීම හා ආයෝජකයින් ඉදිරිපත් නොවීම, විශේෂිත කාර්යය මණ්ඩල බඳවා ගැනීම ප්‍රමාදවීම මෙම තත්ත්වයට හේතු වූ අතර දැනටමත් එකී ආයතනය නව තාක්ෂණය තුලින් ඉදිරියට ගෙන ඒමට අප අමාත්‍යාංශ සහාය නොමදව ලබාදෙන බවද ඒ සඳහා අවශ්‍ය පියවර ඉදිරියේදී ගැනීමටත් සටහන් කර ගනිමි. | පර්යේෂණ මඟින් සොයාගන්නා නව තාක්ෂණයන් සඳහා වෙළඳපොල පුළුල් කර ගැනිම සඳහා සහ සමාජගත කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 04 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 01 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 15ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 14 ක් පැවතුණි. | අමාත්‍යාංශය සඳහා අනුමත මාණ්ඩලික නිලධාරී තනතුරු 13 සඳහා නිලධාරීන් 09 දෙනෙකු අනුයුත්ත කර ගැනීමට හැකිවිය. ද්විතීය හා තෘතීය මිට්ටම් වල නිලධාරීන් ලබාදෙන ලෙස දිගින් දිගටම ඉල්ලීම් කළද රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් දැනුම්දෙනු ලැබූයේ නව බඳවා ගැනීම් කරන තුරු අදාළ පුරප්පාඩු පිරවීමට නිලධාරීන් ලබාදිය නොහැකි බවයි. කෙසේ වෙතත් වසරක් තුළ ද්විතීයික මට්ටමේ තනතුරු අතරින් අනුමත තනතුරු 30 ක් සඳහා නිලධාරීන් 15 ක් අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ගැනීමට හැකි වූ අතර මේ වන විට අනුයුක්ත නිලධාරීන් සංඛ්‍යාව 17 ක් දක්වා වර්ධනය වී ඇත. ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් බඳවා නොගන්නා ලෙස චක්‍රලේඛ මඟින් දැනුම්දී ඇති අතර එම ගණයේ නිලධාරීන් බහුකාර්යය බලකායෙන් ලබාදෙන බවට ප්‍රකාශකර තිබුණද ඒ අයුරින් නිලධාරීන් ලබා දීමක්ද නිසි පරිදි සිදු නොවුණි. කෙසේ වෙතත් ප්‍රාථමික මට්ටමෙහි රියදුරු තනතුරු සඳහා නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර ගැනීමට හැකිවිය. | ආයතනයේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමට හැකි පරිදි අවශ්‍යම වන කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාමට අදාලවන ක්‍රියාමාර්ග ගත යුතුය. |